(හත්වැනි පාර්ලිමේන්තුව — පළමු වැනි සභාවාරය)

අංක. 1]

# පාර්ලිමේන්තුවේ

# න්‍යාය පුස්තකය

## 2010 මැයි මස 18 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට

## නිකුත් කළේ 2010 මැයි මස 07 වැනි සිකුරාදා

---

### 2010 මැයි මස 18 වැනි අඟහරුවාදා

### වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0002/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කිරින්ද - යාල සිට රන්මිණිතැන්න ගම්මානය දක්වා අක්කර 7000 ක භූමි භාගයක් තුළ වසර 40කට අධික කාලයක සිට ගොවි පවුල් 4500 - 6000 අතර ප්‍රමාණයක් හේන් ගොවිතැනින් තම ජීවිකාව රැකගන්නා බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අසරණ හේන් ගොවියන්ගේ ගොවිබිම් ඔවුන්ට අහිමි කිරීමේ සැලැස්මක් තිබේද ;

(ii) එසේ නම්, එම උත්සාහය වහා නතර කරන්නට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ගොවිබිම් නිරන්තරයෙන් වල්අලින්ගේ හානියට ගොදුරු වන්නෙහි ද;

(ii) එසේ නම්, මෙම හානි මගහරවා ගැනීමට ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද;

(iii) මෙම ගොවිබිම් සඳහා ජලය, විදුලිය, මංමාවත් ආදී යටිතල පහසුකම් ලබා දී ගොවි බිම් ලෙස සංවර්ධනය කර එම ගොවි බිම්වල අයිතිය ගොවීන්ට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේනම්, ඒ මන්ද?

0003/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සූරිවිරුගම ග්‍රාම නිලධාරී වසමට අයත් කෝංකැටිආර ග්‍රාමයේ ජීවත් වන ජනතාවගෙන් බහුතරයකගේ ජීවනෝපාය වසරකට එක් වරක් පමණක් කළ හැකි හේන් ගොවිතැන බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) කෝංකැටිආර ග්‍රාමයේ පිහිටි මෙම වගාබිම් ප්‍රදේශය තුල 2009 සැප්තැම්බර් මස සිට අවට වනාන්තර තුළ සිටින වල් අලි ගෙනවිත් විදුලි වැටක් ඉදිකර කොටුකිරීම තුලින් අසරණ පවුල් 300කට පමණ අක්කර 3000ක පමණ තම හේන් බිම් ප්‍රමාණය අහිමි වූයේද ;

(ii) එසේ නම්, ගොවි බිම් අහිමිව අසරණ වූ මෙම හේන් ගොවියන්ගේ වගා බිම් නැවත ඔවුනට ලබා දීමට කටයුතු කරන්නේද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0004/'10

3.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1958 අංක 01 දරන කුඹුරු පනතින් අද ගොවියාගේ අද අයිතිය, ඉඩම් අයිතිය, අනුප්‍රාප්තික අයිතිය සහ අනෙකුත් අයිතිවාසිකම් රැකගත් බවත්;

(ii) එම අයිතීන් සියල්ලක්ම 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් අහෝසි වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) තම අයිතීන් අහිමි වූ ලක්ෂ 04 පමණ වන ලංකාවේ අද ගොවි පවුල්වල අද අයිතිය සුරක්ෂිත කිරීම පිණිස නව කුඹුරු පනතක් ඉදිරිපත් කිරීමට එතුමා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කුමන කාල වකවානුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0008/'10

4.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ සම්පූර්ණ නම කවරේද;

(ii) ඔහු එම තනතුරේ වැඩ භාර ගනු ලැබුවේ කවදාද;

(iii) ප්‍රධාන අමාත්‍යධූරයේ වැඩ භාර ගැනීමෙන් පසුව ඔහු හමුවීමට විදේශ රාජ්‍ය නියෝජිතයින් පැමිණියේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ පැමිණි විදේශ නියෝජිතයින්ගේ නම් කවරේද;

(v) ඔවුන් පැමිණි දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විදේශ නියෝජිතයින් පැමිණියේ කවර අයෙගේ ආරාධනාවන් මතද;

(ii) එම විදේශ නියෝජිතයින් සාකච්ඡා කළ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0009/'10

5.

ගරු රවී කරුණානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ණය ලබාගත් විදේශ ආයතනය

හා අදාළ ණය ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ මිනුම් සිදුකොට සිතියම්ගත කිරීමට ඉලක්ක කළ කැලෑ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) සිතියම්ගත කළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ඊට වැයකළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ව්‍යාපෘතිය යටතේ උපදේශකවරුන් ලෙස බඳවාගත් විදේශිකයින් සඳහා ගෙවූ මුදල කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ විදේශ සංචාර කළ අය කවුරුන්ද;

(iii) එම විදේශ සංචාර සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) උක්ත ව්‍යාපෘතිය යටතේ වනාන්තරවල මායිම් සඳහා ගන්නා ලද කොන්ක්‍රීට් මායිම් කණු සංඛ්‍යාව හා වැය කළ මුදල කොපමණද;

(ii) ඉතිරිව ඇති කණු සංඛ්‍යාව කොපමණද;

(iii) අවශ්‍ය සංඛ්‍යාව සමග සංසන්දනය කිරීමේදී ඉතිරිවන කණු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතියේ සිතියම්ගත කිරීම් හා යොදාගන්නා ලද මායිම් කණු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0010/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලක් සතොස ආයතනයේ මානව සම්පත් හා පරිපාලන අධ්‍යක්ෂවරයාගේ නම කුමක්ද;

(ii) ඔහුගේ නම ප්‍රියාල් පෙරේරාද;

(iii) එසේ නම්, ප්‍රියාල් පෙරේරා මහතාගේ සුදුසුකම් හා වයස කවරේද;

(iv) පැමිණීමේ ලේඛනයක් අත්සන් කිරීමෙන් තොරව වසර 2 ක කාලයක් සඳහා (2006 - 2008) ලබා නොගත් නිවාඩු වෙනුවෙන් රුපියල් 80,000/- ක මුදලක් ඔහු විසින් ලබා ගත්තේ කෙසේද;

(v)

| | | |
|---|---|---|
| වැටුප් සඳහා | රු. | 115,000/- |
| ගමන් වියදම් | රු. | 43,500/- |
| ඉන්ධන | රු. | 20,000/- |
| දුරකථන | රු. | 2,500/- |

වශයෙන් මාසික වැටුප් හා දීමනා ඔහු ලබා ගත්තේ කිනම් කාල සීමාවක් තුළද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එවැනි වරප්‍රසාද ලබන අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0024/'10

7.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පාසල් සිසුන් සඳහා ඉංග්‍රීසි, දෙමළ හා ජපන් භාෂා ඉගැන්වීමට "ග්‍රාමීය අධ්‍යාපන සංවර්ධන ඇකඩමිය" නම් වූ ආයතනයක් දකුණු පළාත ඇතුළු පළාත් ගණනාවක ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත පාසල් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අනෙකුත් පළාත් සහ පාසල් කවරේද;

(iii) ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලින් එම ආයතනයට අනුමතිය දී තිබේද;

(iv) ඒ කවර දිනයන්හි දී, කවුරුන් විසින්, කවර කොන්දේසි යටතේ ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ සිසුන්ගෙන් මුදල් අය කරන්නේ නම්, එක් සිසුවෙකුගෙන් අයකරන මුදල කොපමණද;

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය හෝ රජයේ වෙනත් ආයතනයක් විසින් ඊට අනුමතිය ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0025/'10

8.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පාසල් සිසුන් සඳහා ඉංග්‍රීසි, දෙමළ හා ජපන් භාෂා ඉගැන්වීමට, "ග්‍රාමීය අධ්‍යාපන සංවර්ධන ඇකඩමිය" නම් වූ ආයතනයක් මගින් දකුණු පළාත ඇතුළු පළාත් ගණනාවක ක්‍රියාත්මක ව්‍යාපෘතියට ගුරුවරුන් බඳවා ගැනීමේදී අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

(ii) එම ගුරුවරුන් ඉංග්‍රීසි, දෙමළ හෝ ජපන් ආදී භාෂා ඉගැන්වීමට සුදුසු අය බවට සහතිකයක් තිබේද;

(iii) මෙම ව්‍යාපෘතිය රාජ්‍ය ආයතනයක් මගින් අධීක්ෂණය කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවුරුන්ද විසින්ද;

(v) අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතියක් ලබා හෝ නොලබා තිබුණද අදාළ කොන්දේසි අනුව කටයුතු කර නැත්නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0026/'10

9.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2011 වසර උසස් පෙළ විභාගයට පෙනී සිටීම සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශපාලන විද්‍යාව හා කෘෂිකර්මය විෂයයන් හදාරන සිසුන් සඳහා විෂය නිර්දේශ සකස් කර තිබේද ;

(ii) එසේ නම්, ඒවා පාසල්වල ඉගැන්වීමට යොදා ගන්නේද ;

(iii) නොඑසේ නම්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් එම විෂයයන් හදාරන සිසුන් විභාගය සඳහා ඉදිරිපත් කරනු ලබන්නේ කවර විෂය නිර්දේශය යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 සැප්තැම්බර් මස 30 වැනි දිනැති අංක 1621/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් මස 09 වැනි දිනැති අංක 1627/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2009 දෙසැම්බර් මස 20 වැනි දිනැති අංක 1632/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*4

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2009.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිපාලන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) මාසික වැටුප පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156(3) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) | රු. 65,000/- |

තවද, මෙම මාසික වැටුප තුළ මීට ප්‍රථම පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති ගෙවල් කුලී දීමනාව ද ඇතුළත්ව ඇති බැවින්, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට (ඔම්බුඩ්ස්මන්) රු. 65,000/- ක මාසික වැටුපට අමතරව 2009.01.01 දින සිට වෙනත් දීමනා සඳහා හිමිකමක් නොමැති බව ද, මෙම පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් නිශ්චය කරනු ලැබේ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2009 අගෝස්තු 24 වැනි දිනැති අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**2010 මැයි මස 19 වැනි බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0005/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද ;

(ii) එම බල ප්‍රදේශ කවරේද ;

(iii) ගොවිජන කෙන්ද්‍ර මට්ටමින් සිටින අද ගොවියන් ප්‍රමාණය කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අද ගොවියන්ගේ ලිපිනයන් ඇතුළු නාම ලේඛනයක් ගොවිජන කෙන්ද්‍ර මට්ටමින් ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0006/’10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද ;

(ii) ඒවා කවරේද ;

(iii) ගොවිජන කේන්ද්‍ර මට්ටමින් සිටින්නා වූ අද ගොවියන් ප්‍රමාණය කොපමණද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අද ගොවියන්ගේ ලිපිනයන් ඇතුළු නාම ලේඛනයක් ගොවිජන කෙන්ද්‍ර මට්ටමින් ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0007/’10

3.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කිරිඳි ඔය මෝය සිට දොර ඔය මෝය දක්වා අක්කර 396ක් පුරා පැතිරුණු කිලෝමීටර් 4.05 ක් දිග, කිලෝමීටර් 1.05 ක් පළල, මීටර් 30ක් උස් වූ මාගම වැලිවැටිය ගැන එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වැලිවැටිය නිසා කුඹුරු අක්කර 676 ක් හා අතිරේක බෝග අක්කර 31 ක ගොවිබිම් ප්‍රමාණයක් මුහුදු රළෙන් ආරක්ෂා වන බවත් ;

(ii) මෙම වැලි වැටිය දකුණ ලකට අවේනික පළු, වීර, රණවරා යන ශාකයන්ගෙන් ආවරණය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම වැලි වැටිය එහි ඇති ඉල්මනයිට් සහ ගුැනයිට් යන ඛනිජ ලබා ගැනීම සඳහා විදේශීය සමාගමක් වෙත පවරා ඇති බවත්

(ii) අඩි අටක් පමණ යටින් පිහිටා ඇති මෙම ඛනිජ ලබා ගැනීමේදී පොලොව මට්ටමේ සිට ඉහලින් ඇති වැලි ස්ථරයෙන් 60% ක් පමණ ඉවත් කිරීමෙන් මාගම සහ අවට ගම්මානවලට අහිතකර බලපෑම් ඇති වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එම අහිතකර බලපෑම් මගහරවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ව්‍යාපෘති කමිටුව මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රදේශවාසීන්ගේ කැමැත්ත විමසුවේද ;

(iii) ජනතා විරෝධතා මධ්‍යයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ නම්, එසේ කරන ලද්දේ කාගේ මග පෙන්වීමක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0011/’10

4.

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යටතේ ස්ථාපනය කර ඇති “මග නැගුම” ව්‍යාපෘතිය මගින් 2008 වර්ෂයේ සිට මේ දක්වා ඉදිකර ඇති මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් මාර්ගය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එකී ඇස්තමේන්තුගත මුදලින් මේ දක්වා වැයකර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කර ඇති මහාමාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම යටතේ දිවයින පුරා විවෘත කර ඇති කාර්යාල සහ රථවාහන අංගන සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0012/’10

5\.
ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1999 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වයඹ පළාත් සභාවේ ගිණුම් වාර්තා එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) ඉහත ගිණුම් වාර්තාවලින් අනාවරණය වූ දූෂණ හා වංචාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වූයේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම දූෂණ හා වංචාවලට සම්බන්ධ නිලධාරීන් හා අනෙකුත් පුද්ගලයන්ට එරෙහිව ගනුලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තර වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) විනය පරීක්ෂණ නිගමනයන්ට අනුව චූදිත නිලධාරීන් සේවයෙන් පහ කිරීමට කටයුතු කළේද;

(ii) නොඑසේ නම්, චූදිත නිලධාරීන් තවදුරටත් සේවයේ යොදවාගෙන සිටින බලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0013/’10

6\.
ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අප රටේ ධීවරයින් විශාල සංඛ්‍යාවක් ඉන්දීය රජයේ අත්අඩංගුවේ පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2009 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ ඉන්දීය රජය විසින් අත්අඩංගුවට ගනු ලැබූ ධීවරයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට අත්අඩංගුවේ පසුවන ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iii) අත්අඩංගුවේ පසුවන ධීවරයින් නිදහස් කර ගැනීමට ගෙන තිබෙන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2010 මැයි මස 20 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0014/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වසර 10 ක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යුද හමුදාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) වැටුප් හා වේතන සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) පසුගිය අවුරුදු පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී යුද හමුදාවේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රෙජිමේන්තුවක හෝ කණ්ඩායමක සිටින යුද හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පදනම මත සේවයේ යොදවන ලද යුද හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0015/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,—

(අ) (i) 2008 වර්ෂයේ සිට මේ දක්වා දිවයින පුරා වාර්ෂිකව සිදු වී ඇති රිය අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින්, මාරක රිය අනතුරු සංඛ්‍යාව හා සාමාන්‍ය රිය අනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම රිය අනතුරු අතුරින් අධික වේගයෙන් ධාවනය කිරීම හේතුවෙන් සහ මත්ද්‍රව්‍ය ගැනීමෙන් පසු රිය ධාවනය කිරීම හේතුවෙන් සිදුවී ඇති අනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම අනතුරු හේතුවෙන් මියගිය හා තුවාල ලැබූ හෝ ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙසේ දිවයින පුරා සිදුවන රිය අනතුරු වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0016/'10

3.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වසර 10 ක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) ගුවන් හමුදාවේ සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) වැටුප් හා වේතන සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) පසුගිය අවුරුදු පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ගුවන් හමුදාවේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රෙජිමේන්තුවක හෝ කණ්ඩායමක සිටින ගුවන් හමුදා සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පදනම මත සේවයේ යොදවන ලද ගුවන් හමුදා සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 ජූනි මස 08 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0017/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,—

(අ) (i) 2000 වර්ෂයේ සිට වන්දි හිමිකම් ලැබීමට නියමිත ආරක්ෂක හමුදාවේ පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වන්දි හිමිකම් ලෙස ලබාදෙන මුදල කොපමණද;

(iii) මේ වන විට කොපමණ සංඛ්‍යාවකට වන්දි හිමිකම් ලබා දී තිබේද;

(iv) අදාළ වන්දි හිමිකම් ලබාදීම කල් ගතවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0019/'10

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 ජනවාරි මස 01 වැනි දින සිට මේ දක්වා චීන රජය හෝ චීන සමාගම් මඟින් ශ්‍රී ලංකාව තුළ මෙහෙයවනු ලබන සියලුම ව්‍යාපෘතිවල නම් මොනවාද;

(ii) එම ව්‍යාපෘති මෙහෙයවනු ලබනුයේ ණය පහසුකම් හෝ ප්‍රදාන යටතේ ද, නැතහොත් හවුල් ව්‍යාපාර ලෙස ද,

(iii) ඉහත ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රභවයන් සහ සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0020/'10

3.

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "මගනැගුම" ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද 2004.01.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ස්ථාපිත කර ඇති ආයතන කවරේද;

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කර ඇති මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ආයතනයේ වත්මන් සභාපතිවරයාගේ නම හා ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) එම සභාපතිවරයාට ගෙවනු ලබන මාසික වැටුප හා වෙනත් දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපිනයන් සහ ඔවුන් සඳහා ගෙවන ලද වැටුප් හා වෙනත් දීමනා කවරේද,

(ii) එහි විධායක නිලධාරීන්ගේ නම් හා අදාළ තනතුරුද, ඔවුන් ලබන වැටුප්, වේතන හෝ දීමනා කවරේද;

යන්න 2007, 2008, 2009 හා 2010 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉහත ආයතනයට කුළී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව, එක් එක් වාහනය අයත් ආයතනය හෝ පුද්ගලයන් සහ එක් එක් වාහනය සඳහා ගෙවනු ලබන ඉන්ධන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2010 ජූනි මස 11 වැනි සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අමාත්‍ය ධූරයන් දැරීමෙන් වැළැක්වීම,— ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, තම ඇමතිවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත් ජනාධිපතිවරයා හා අගමැතිවරයා කිසිදු අමාත්‍ය ධූරයක් නොදැරිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි

පා. 2/'10

2

ගරු රවී කරුණානායක මහතා,— අවි ආයුධ ලියාපදිංචි කිරීම,— ශ්‍රී ලංකාවේ පවතින සියලුම අවි ආයුධ ලියාපදිංචි කළ යුතු අතර, එසේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව යම් කිසිවෙකු ලියාපදිංචි නොකළ ආයුධයක් ළඟ තබා ගෙන අසුවුවහොත්, අපරාධ නීතිය උල්ලංඝණය කිරීමේ වරද යටතේ ඔහුට එරෙහිව නඩු පවරා, අවුරුදු 20 ක අනිවාර්ය සිර දඬුවමකට යටත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 3/'10

3.
ගරු රවී කරුණානායක මහතා,— බැංකු ගනුදෙනු වේලාවන් දීර්ඝ කිරීම,— රටේ ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා බැංකු ගණුදෙනු වේලාවන් පැය 9.00 සිට පැය 16.00 දක්වා දීර්ඝ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 4/'10

4.
ගරු රවී කරුණානායක මහතා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබාදීම,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගි වීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 5/'10

5.
ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 6/'10

6.
ගරු රවී කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 7/'10

7.
ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 8/'10

8.
ගරු රවී කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 9/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 10/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 11/'10

11.

ගරු රවී කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

15.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා

ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

16.

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 17/'10

17.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් නීතිගත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා " තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

18.

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'10

19.

ගරු රවී කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

20.

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

21.

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

22.

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 23/'10

23.

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් වහාම ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව වහාම ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

24.

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

25.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ස්ත්‍රී අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

26.

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණ ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් ඇතුළු විවිධ දක්ෂතා ඇති පුරවැසියන්ට තම නව නිපැයුම් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩපිළිවෙලක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

27.

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

28.

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

29.
ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

30.
ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩපිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

31.
ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

32.
ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

33.
ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 34/'10

34.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා, —පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවීම, —කර්මාන්ත වැඩි දියුණු කිරීමේ හා තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දීමේ අදහසින් පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවිය යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'10

35.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා, — කල්මුනේ නගරය තුළ පිහිටි සාතන්කර්නි මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම, —දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ගේ විවිධ වූ ක්‍රීඩා කුසලතාවයන් හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා උසස් තත්වයේ පහසුකම් සපයාදීමේ අදහසින් කල්මුනේ නගරය තුළ පිහිටි සාතන්කර්නි මහජන ක්‍රීඩාංගනය සියලු පහසුකම් සහිත ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*1.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසුව අධ්‍යාපන ක්‍රමය ප්‍රමාණාත්මකව වර්ධනය වී ඇතත් ඊට සාපේක්ෂව අධ්‍යාපනය ගුණාත්මකව සහ ව්‍යුහාත්මකව වර්ධනය නොවීම නිසා ගුරුවරුන්ටත් සිසු දරු දැරියන් සහ දෙමාපියන්ටත් පීඩාකාරීවන වටපිටාවක් නිර්මාණය වී ඇති හෙයින් ද,

එම කරුනට අදාලව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ අකටයුතු හා අසාධාරණකම් මෙන්ම වංචා සහ දූෂණ සිදුවන බවට සමාජ මතයක් නිර්මාණය වී ඇති හෙයින් ද,

සමස්ථ අධ්‍යාපන ක්‍රමයේ සුවිශාල වෙනස්කම් සහ ප්‍රතිසංස්කරණ රසක් සිදුවිය යුතු බවට පොදු ජන මතයක් ගොඩනැගී ඇති හෙයින් ද,

මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි දක්වා ඇති දැණුම කේන්ද්‍රීය සංවර්ධන උපාය මාර්ගය සැලකිල්ලට ගනිමින්ද,

සමස්ත ලාංකීය ශිෂ්‍ය පරම්පරාවේ අනාගතය නිර්මාණය කිරීමට අදාල වන ලෙස ළදරු පාසල් අවධියේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා සිසුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට අදාලවන පරිදි ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම කල් දැමිය නොහැකි සහ ජාතික ප්‍රමුඛතාව ලැබිය යුතු කරුණක් හෙයින් ද,

(අ) පෙර පාසැල්, ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික අධ්‍යාපනයෙහි ඇති විය යුතු ප්‍රමාණාත්මක, ගුණාත්මක සහ ව්‍යුහාත්මක වෙනස්කම් වේ දැයි සොයා බැලීම පිණිසද,

(ආ) ජාතික, ආගමික සහ සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමය තුළ ඇති කළ යුතු වෙනස්කම් පිළිබඳව සොයා බැලීම පිණිසද,

(ඇ) පිරිවෙන් අධ්‍යාපනයේ සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳව සොයා බැලීම පිණිසද,

(ඈ) පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් තිබේද යන්න සොයා බැලීම පිණිසද,

(ඉ) සියලුම විභාග සහ පරීක්ෂණ ප්‍රතිඵල ඉහළ මට්ටමකට ගෙන ඒම සහ උසස් අධ්‍යාපන සුදුසුකම් නොලබන සිසුන් වෙනුවෙන් අධ්‍යාපන ක්‍රමය තුළ ලබා දිය හැකි විකල්ප ක්‍රියා මාර්ග ඇතිකළ යුතුද යන්න සොයා බැලීම පිණිසද,

(ඊ) විශ්ව විද්‍යාලයට ඇතුල්වීම සඳහා සුදුසුකම් ලැබුවත් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයකට ඇතුලත් නොවී විදේශයන්හි අධ්‍යාපනය ලැබීම පිණිස විදේශ ගතවන සිසුන්ට මෙරට තුළදීම අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා ලබා දිය හැකි ක්‍රමවේදයන් වේදැයි සොයා බැලීම පිණිසද,

(උ) අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මකවීම තුළ ප්‍රාදේශීය, ජාතීන් සහ ආගමික වශයෙන් පවතින විෂමතා ඉවත් කිරීමට ගතයුතු ක්‍රමවේදයන් කවරේදැයි සොයා බැලීම පිණිසද,

(ඌ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදී මධ්‍යම රජය සහ පළාත් සභා අතර ඇතිවිය යුතු අන්තර් සම්බන්ධතාවන්හි ස්වභාවය පිළිබඳව සොයා බැලීම පිණිසද,

(එ) අධ්‍යාපන ක්‍රියාවලියේදී, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමස්ථ අධ්‍යාපනවේදීන්ගේ වගකීම සහ කාර්යය නිශ්චය කිරීම සඳහා ගතයුතු පියවර කවරේදැයි සොයා බැලීම පිණිසද,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2.) (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසිඑක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(ඇ) එහි වාර්තාව එහි පළමු රැස්වීමේ සිට මාස තුනක(03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කෙරෙන එවැනි කාල පරිච්ඡේදයක් තුළ දී පාර්ලිමේන්තුව ඉදිරිපත් කළ යුතුය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතුය.

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාල ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට බලය තිබිය යුතු ය.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**